# උචිත පාංශු පරිසරයක බෝග සංස්ථාපනය කිරීමේ සූදානම

## 05 පාඩම

Faculty of Technology
University of Ruhuna

**ඉහළ කෘෂිකාර්මික නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා බෝග පරිසර සංකීර්ණයේ වෙනස්කම් සිදු කිරීම ශෂ්‍ය විද්‍යාව ලෙස හඳුන්වයි. මේ අනුව ඉහළ බෝග නිෂ්පාදනයක් ලබා ගැනීමට සුදුසු පරිසරයක් ලබා දීම ශෂ්‍ය විද්‍යාවේ මූලික අරමුණ වේ.**

## බිම් සැකසීම

බීජ ප්‍රරෝහණය හා ඉන් පසුව මනා බෝග වර්ධනයක් ලබා ගැනීම සඳහා පස භෞතිකව සකස් කිරීම

**ප්‍රධාන අරමුණු** -

බෝග වගාව සඳහා සුදුසු වැපුරුම් බිමක් සකසා ගැනීම සහ පාංශු ලක්ෂණ වැඩි දියුණු කිරීම


**බිම සැකසීමෙන් ඉටුවන අනෙකුත් අරමුණු** -

- වල් පැළ පාලනය කිරීම
- පස මතුපිට වූ කාබනික ද්‍රව්‍ය පස සමග මිශ්‍ර කිරීම
- රෝග පළිබෝධ පාලනය කිරීම
- පාංශු හා ජල සංරක්ෂණය කිරීම
- පසේ ඇති අනවශ්‍ය ද්‍රව්‍ය ඉවත් කිරීම
- වැඩි අස්වැන්නක් ලබා ගැනීමට සුදුසු තත්ත්ව ලබා දීම


**බිම් සකස් කිරීමෙන් පසෙහි සිදු වන වෙනස්කම්**

* අහඹු රළු බව
* දෘශ්‍ය සනත්වය
* සවිවරතාව

## බිම් සැකසීමේ පියවර හා ක්‍රම





## බිම් සැකසීමේ ක්‍රම






** අවම බිම් සැකසීමේ අන්ත අවස්ථාව ලෙස මෙය හැඳින්විය හැකි ය.

මඩ කිරීම - වී වගාව සඳහා බිම් සකස් කරන්නේ මඩ කිරීමෙනි


## බිම් සැකසීම සඳහා උචිත උපකරණ






## යන්ත්‍ර බලයෙන් ක්‍රියා කරන ද්විතීයික බිම් සැකසීමේ උපකරණ




- කොකු නගුල
- තැටි පෝරුව
- ඇණ දත් පෝරුව
- රිජරය

- රොටවේටරය
- ඇණ දත් පෝරුව


## බෝග සංස්ථාපන ක්‍රම

බෝග සංස්ථාපනය - ක්ෂේත්‍රයේ බීජ හෝ පැළ සිටුවා, ඒවා ප්‍රරෝහණය වී බෝගයක් ලෙස වැඩීමට සැලැස්වීම

- *** එය රෝපණ ද්‍රව්‍ය, රෝපණ ද්‍රව්‍යවලට කරන ලද ප්‍රතිකාර, සිටුවන කාලය, සිටුවන ගැඹුර හා සිටුවන ආකාරය ආදී කරුණු මෙන් ම පාංශු සාධක හා පාරිසරික සාධක මත ද රඳා පවතී.

## විවිධ බෝග සංස්ථාපන ක්‍රම

- බීජ සිටුවීම
- පැළ සිටුවීම



## තවාන් සකස් කිරීම

තවානක් යනු රෝපණ ද්‍රව්‍ය සිටුවන ස්ථිර භූමියේ වගා කරන තෙක් ආරක්ෂිතව රැක බලා ගන්නා ස්ථානයකි

නැතහොත්

රෝපණ ද්‍රව්‍ය මගින් නව ශාකයක් බිහි කර ගැනීමේ සිට නිරෝගී, ඒකාකාරී, පවතින පරිසර තත්වයන්ට ඔරොත්තු දීමට හැකි වන සේ හුරු කරන ලද පැළ, කෙටි කාලයක් තුළ දී ක්ෂේත්‍රයේ සිටු වීම සඳහා නිපදවන ස්ථානයකි.

## තවාන් දැමීමේ වැදගත්කම

- සිටුවීම සඳහා සුදුසු නිරෝගී හා දිරිමත් පැළ ලබා ගැනීමට හැකි වීම
- ඒකාකාරී පැළ ගහනයක් ලබා ගැනීමට හැකි වීම
- පලතුරු බෝග, ස්ථිර වැවිලි බෝග සහ අපනයන කෘෂිකාර්මික බෝග වගාවේ දී තේරීමක් කර නිරෝගී පැළ පමණක් සිටුවා ගැනීමෙන් වැඩි ආර්ථික වාසි ලබා ගත හැකි වීම
- බීජ එක වර ක්ෂේත්‍රයේ සිටු වීම නිසා සිදු විය හැකි හානි අවම වීමෙන් අපතේ යන බීජ ප්‍රමාණය අඩු වීම නිසා බීජවලට යන වියදම අඩු වීම
- අඩු ඉඩ ප්‍රමාණයකින් වැඩි පැළ සංඛ්‍යාවක් ලබා ගත හැකි වීම
- තවානේ පැළ රැඳෙන කාලය තුළ ක්ෂේත්‍රය පිළියෙල කර ගැනීමට හැකි වීම නිසා කන්න අතර පරතරය අඩු කර ගත හැකි වීම
- වගා පාළු අවම කර ගත හැකි වීම
- නඩත්තු කටයුතු පහසු වීම
- තවාන් පැළ නිෂ්පාදනය ආර්ථික ව වාසිදායක ව්‍යාපාරයක් ලෙස පවත්වා ගෙන යා හැකි වීම

ප්‍රදේශයේ පවතින කාලගුණික තත්වයන්ට උචිත වන සේ ද භූමියේ පිහිටීම හා බෝග වර්ගය අනුව ද තවාන් වර්ගය තෝරා ගත යුතු ය.

## තවාන් ආකාර කීපයකි.

- * පාත්ති තවාන් (තවාන් පාත්ති)
    - උස් තවාන්
    - ගිල් වූ තවාන්
- * බඳුන් තවාන්
- * විශේෂ තවාන්
    - වැලි තවාන්
    - නොරිඩෝකෝ තවාන්
    - ස්පොන්ජ් තවාන්
    - සුසංහිත තවාන්
    - තැටි තවාන්

## තවාන් ජීවාණුහරණය කිරීම

- * තවාන් පිළිස්සීම
- * තවානට දිලීර නාශක යෙදීම
- * අධික සූර්ය තාපයට භාජනය කිරීම
- * තවාන ධූමකරණය කිරීම
- * නටන උණු ජලය යෙදීම

## තවාන් පැළ නඩත්තුව

- * ජල පාලනය
- * පෝෂක සැපයීම
- * සෙවණ සැපයීම/ආවරණ සැපයීම
- * පලිබෝධ පාලනය
- * පැළ දැඩි කිරීම

# Written By,
# Students of University of Ruhuna
# Faculty of Technology